රුහුණ විශ්වවිද්‍යාලය

2016/2017 ශාස්ත්‍රවේදී (සාමාන්‍ය/විශේෂ) උපාධි - 2000 ස්ථලය
පළමු සමාසික පරීක්ෂණය - 2017 ඔක්තෝබර්/නොවැම්බර්

GEO 21613 / 21513 – භූගෝල විද්‍යාවේ නව දැක්ම සහ ප්‍රවේශය

ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

කාලය : පැය 03

---

01. (i) භෞතික හා ප්‍රමාණාත්මක භූගෝල විද්‍යා ක්ෂේත්‍රයේ දියුණුවට ග්‍රීක භූගෝල විද්‍යාඥයින්ගේ දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ii) ක්‍රි.ව. 200 සිට ක්‍රි.ව. 700 දක්වා කාලය යුරෝපයේ අඳුරු යුගය ලෙස ඉතිහාසඥයින් හැඳින්වූයේ ඇයි? සුදුසු උදාහරණ ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 08)

02. (i) භූගෝල විද්‍යා විෂය ක්ෂේත්‍රය ප්‍රවර්ධනය සඳහා ක්ලූඩියස් ටොලමිගේ (Cludius Ptolemy) දායකත්වය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ii) "මහා ගවේෂණ යුගයේ සිටි සියලුම ගවේෂක නායකයින් විසින් ටොලමිගේ භූගෝල විද්‍යා දැනුම උපයෝගී කර ගැණිනි." මෙම කියමන සුදුසු උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 08)

03. (i) භූගෝල විද්‍යා අධ්‍යයන සඳහා යොදා ගැනෙන භෞතික හා සංස්කෘතික කලාප මොනවාද? සුදුසු උදාහරණ සහිතව කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 07)

(ii) ප්‍රාදේශීය භූගෝල විද්‍යා අධ්‍යයන සඳහා ආකෘති භාවිතයේ වැදගත්කම උදාහරණ සහිතව විස්තර කරන්න.

(ලකුණු 08)

74

04. (i) තාක්ෂණ භූගෝල විද්‍යාව යනු කුමක්ද?

(ලකුණු 05)

(ii) තාක්ෂණ භූගෝල විද්‍යාවේ උපාංග විවධ කාර්යයන් සඳහා භාවිත කරන ආකාරය උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

(ලකුණු 10)

05. "සමකාලීන ලෝකයේ අප මුහුණ දෙන පාරිසරික සහ මානව අර්බුද තේරුම් ගැනීමට සහ විසඳා ගැනීමට බුද්ධිමය දායකත්වය සැපයීම නූතණ භූගෝල විද්‍යාවේ සහ භූගෝල විද්‍යාඥයාගේ කාර්යභාරයයි." ඉහත ප්‍රකාශය විභාග කරන්න.

(ලකුණු 15)

06. "සෑම දෙනාම ත්‍රස්තවාදය නතර කිරීම පිළිබඳ කරදර වෙති. සැබවින්ම ඒ සඳහා පහසු විධියක් තිබේ. එනම් ඒ සඳහා සහභාගීවීම නතර කිරීමයි."

- නෝර්ම් චොම්ස්කි -

ත්‍රස්තවාදය නිර්මාණය වීම කෙරෙහි බලපාන මූලාශ්‍ර ඇසුරෙන් ඉහත ප්‍රකාශය විභාග කරන්න.

(ලකුණු 15)

07. "ස්ත්‍රී-පුරුෂ සමාජභාවය (Gender) පදනම්කරගත් භූගෝල විද්‍යාත්මක අධ්‍යයන සමකාලීන ලෝකයේ ස්ත්‍රීන් මුහුණ දෙන ගැටලු අවබෝධ කරගැනීමට දායකවී ඇත." මෙම ප්‍රකාශය යෝග්‍ය නිදසුන් ඇසුරින් සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

@@@@@@@